මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : LAE/2025/15

2025.03.16

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

### නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීම

1. බලය නොමැති තැනැත්තෙකු විසින් භාර දී තිබීම;
2. නියමිත අපේක්ෂක සංඛ්‍යාව නොමැති වීම හෝ නියමිත සංඛ්‍යාවට වඩා වැඩිපුර අපේක්ෂකයන් ඇතුළත් කර තිබීම;
3. පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ඇප තැන්පත් නොකිරීම;
4. පක්ෂ ලේකම් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා අත්සන් නොකිරීම;
5. පක්ෂ ලේකම්ගේ හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාගේ අත්සන සාමදාන විනිශ්චයකරුවකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු සහතික කර නොතිබීම;
6. නියමිත අපේක්ෂකයන් ගණන, තරුණ අපේක්ෂකයන් ගණන හා කාන්තා අපේක්ෂකයන් ගණන අන්තර්ගත නොවීම;
7. තරුණ අපේක්ෂකයකු ලෙස නාමයෝජනා පත්‍රයේ සඳහන් කර ඇති අපේක්ෂකයෙකුගේ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්, උපන් දිනය සනාථ කරන දිවුරුම් ප්‍රකාශයක් යන දෙකෙන් එකක් ඉදිරිපත් නොකිරීම හෝ අඩුපාඩු සහිතව ඉදිරිපත් කිරීම; *
8. අපේක්ෂකයකු විසින් නාමයෝජනා පත්‍රයේ අත්සන් නොකිරීම; *
9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත් වන උපලේඛනයේ දිවුරුම/ ප්‍රතිඥාව නොතිබීම හෝ එහි යම් දෝෂ සහගත බවක් තිබීම; *
10. නාමයෝජනා පත්‍රයේ නමක් පමණක් ප්‍රතික්ෂේප වන අවස්ථාවක ඉවත් කරනු ලබන අපේක්ෂකයා තරුණ (කාන්තා/පිරිමි) හෝ කාන්තාවක් වන්නේ නම් අවම තරුණ හෝ අවම කාන්තා නියෝජනය සාක්ෂාත් නොවන බැවින් එම අවස්ථාවේදී සමස්ත නාමයෝජනා පත්‍රයම ප්‍රතික්ෂේප වන බව;
11. නාමයෝජනා පත්‍රයේ නමක් පමණක් ප්‍රතික්ෂේප වන අවස්ථාවක අවම තරුණ හා අවම කාන්තා නියෝජනයට බාධාවක් නොවන්නේ නම් අදාළ අපේක්ෂකයාගේ නම පමණක් ප්‍රතික්ෂේප වන බව;

*** මෙම අවස්ථාවල දී නුසුදුස්සකු වන බවට සොයා ගනු ලැබූ අපේක්ෂයාගේ නම පමණක් එම නාමයෝජනා පත්‍රයෙන් ඉවත්විය යුතු ය. මෙම නම සඳහා වෙනත් නමක් ආදේශ කිරීමට හිමිකමක් නොමැති අතර අපේක්ෂකයා වෙනුවෙන් තැන්පත් කළ ඇප මුදල රාජසන්තක වේ.**

**නාමයෝජනා කාලසීමාවට අදාළ තරුණ අපේක්ෂකයන්ගේ වයස් සීමාව;**

- **2007.01.31 දිනට පෙර උපත ලද අය සහ;**
- **1990.03.20 දිනට පසුව උපන් සහ;**
- **2025.03.20 දිනට වයස අවුරුදු 35ට නොවැඩි අය විය යුතු ය.**

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්